**ශීර්ෂය 211 රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව**
**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජුලි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේද යොමුව | විගණන නිරීක්ෂණය | නිර්දේශය |
|---|---|---|
| සීඑම්/ඩී/ජීපී/එම්එල්/2021 හී1.2.1 (ඈ)(i) | 2015 වර්ෂයේදී තක්සේරු දෙපාර්තමේන්තුව විසින් රුපියල් මිලියන 2200 කට තක්සේරු කර තිබූ කොළඹ 08 පිහිටි දෙපාර්තමේන්තුව සතු ඉඩමේ අයිතිය 2021 වර්ෂයේ නොවැම්බර් 22 දින තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් දෙපාර්තමේන්තුවට පවරා තිබූ නමුත් එම ඉඩමෙහි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | මෙම ඉඩම වත්කමක් ලෙස ගිණුම්ගත කිරීමට කඩිනමින් ක්‍රියාකළ යුතුය. |
| සීඑම්/ඩී/ජීපී/එම්එල්/2021 හී1.2.1 (ඈ)(ii) | 2003 වර්ෂයේ ජනවාරි 31 දින කතරගම ප්‍රාදේශීය ලේකම් විසින් දෙපාර්තමේන්තුවට පවරා දී තිබූ විශාලත්වය හෙක්ටයාර් 0.105 ක් වූ කතරගම පිහිටි ඉඩම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මෙම ඉඩම වත්කමක් ලෙස ගිණුම්ගත කිරීමට කඩිනමින් ක්‍රියාකළ යුතුය. |

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල පිරියත හා උපකරණ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී රුපියල් මිලියන 2200 කට තක්සේරු කර තිබූ 2021 වර්ෂයේ දී තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් දෙපාර්තමේන්තුවට අයිතිය පවරා තිබූ කොළඹ 08 පිහිටි ඉඩමෙහි වටිනාකම හා 2003 වර්ෂයේ ජනවාරි 31 දින කතරගම ප්‍රාදේශීය ලේකම් විසින් දෙපාර්තමේන්තුවට පවරා දී තිබූ විශාලත්වය හෙක්ටයාර් 0.105 ක් වූ කතරගම පිහිටි ඉඩම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | කොළඹ 08 පිහිටි දෙපාර්තමේන්තුව සතුව පවතින ඉඩම හා කතරගම පිහිටි ඉඩම 2022 වර්ෂයට අදාළ තක්සේරු වාර්තාව ලබා ගැනීමෙන් අනතුරුව ඉදිරි කටයුතු කිරීමට පියවර ගෙන ඇති බව දන්වමි. | මෙම ඉඩම වත්කමක් ලෙස ගිණුම්ගත කිරිමට කඩිනමින් ක්‍රියාකළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය අනුව එදිනට එකතු කල අගය මත බදු පාලන ගිණුමේ ශේෂය රු. 41,997,251 ක් වුව ද භාණ්ඩාගාර පොත් අනුව එය 41,306,373 ක් වුයෙන් | රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව වෙත මාරුපත්‍ර ඉදිරිපත් කරනු ලැබුව ද, එය භාණ්ඩාගාර විසින් නිවැරදි කිරීමට කටයුතු කර නොමැති හේතුවෙන් ද මෙම වෙනස සිදු වී ඇත. | ඉදිරියේදි මෙම ගැටළුව ඇති නොවීමට වගබලා ගත යුතුය. |

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ එකතු කල අගය මත බදු පාලන ගිණුමේ ශේෂය රු.690,878 කින් වැඩියෙන් දක්වා තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021 සැප්තැම්බර් 21 දිනැති අංක PFD/RED/WO/2021/30 දරන ලිපිය ප්‍රකාරව 2009 වර්ෂයේ හා ඊට පෙර වර්ෂවල රු.81,019,843 ක් වූ හිඟ ආදායම් ශේෂ පසු විපරම් කර අයකර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා තිබූ නමුදු එයින් කිසිදු මුදලක් සමාලෝචිත වර්ෂයේදී අයකරගෙන නොතිබුණි. | අදහස් දැක්වීමක් සිදු කර නොමැත. හිඟ මුදල් ගෙවන ලෙසට යවා ඇති ලිපි පමණක් ඇමුණුම් ලෙස ඉදිරිපත් කර ඇත. | මෙම හිඟ මුදල් කඩිනමින් අයකර ගැනිමට වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතුය. |
| (ආ) 2010 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලයට අදාල රු. 185,579,595 ක හිඟ ආදායෙමේන් සියයට 2.3 ක් හෙවත් රු.4,296,250 ක් පමණක් සමාලෝචිත වර්ෂයේදී නිරවුල් කරගෙන තිබුණි | අදහස් දැක්වීමක් සිදු කර නොමැත. හිඟ මුදල් ගෙවන ලෙසට යවා ඇති ලිපි පමණක් ඇමුණුම් ලෙස ඉදිරිපත් කර ඇත. | මෙම හිඟ මුදල් කඩිනමින් අයකර ගැනිමට වැඩ පිළිවෙලක් සකස් කර ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) දෙපාර්තමේන්තුවට විවිධ කාර්යයන් ඉටු කරවා ගන්නා ලද රාජ්‍ය ආයතයවලින් ලැබිය යුතු රු. 20,840,046 කින් ආයතන දහයකින් ශේෂ සනාථ කිරීම් ලැබී තිබුනු අතර ආයතන අටකින් ශේෂයන් නොමැති බවට දන්වා තිබුණි. තවද රු. 16,585,005 ශේෂ පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් සනාථ කිරීමට අදාල ලියවිලි ඉදිරිපත් කිරීමට අපොසත් වී ඇත. | අදහස් දැක්වීමක් සිදු කර නොමැත. හිඟ මුදල් ගෙවන ලෙසට යවා ඇති ලිපි පමණක් ඇමණුම් ලෙස ඉදිරිපත් කර ඇත. | මෙම ශේෂයන් වෙනස් වීමට හේතු සොයා බලා කඩිනමින් ශේෂයන් නිවැරදි කර ගත යුතුය. |

## 2.2 වියදම් කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| --------------------- | ------------------------------- | -------------------------- |
| (අ) මු.රේ 66 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කිරිමේදි අදාල බලධාරියා විසින් එම මාරුකිරීම් සඳහා අධිකාරි බලය දෙනතෙක් එවැනි අතිරිත්ත වියදම් නොදැරිය යුතුය යන්න සඳහන් වුවද සමාලෝචිත වර්ශයේ පිළිවෙලින් රු. 11,500,000 හා රු. 20,000,000 වටිනා මාරු පත්‍ර දෙකක් සඳහා නිසි අධිකාරි බලය (අමාත්‍යාංශ ලේකම්ගේ) ලබා ගෙන නොතිබුණි | අතපසුවීමකින් ප්‍රධාන ගණන්දීමේ නිලධාරි මඟින් මෙම මු.රෙ. 66 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කිරීම් සඳහා නිසි අධිකාරි බලය ලබා ගැනීමට නොහැකි වී ඇති නමුත්, මේ වන විට ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. | ඉදිරියේදි මෙම ගැටළුව ඇති නොවිමට වගබලා ගත යුතුය. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් ප්‍රකාශයේ 211-1-2-0-1205 වෙනත් වැය විෂයට අනුව රු.141,742,549 ක ප්‍රතිපාදන සියයට 10 ඉතිරිවීමක් පැවතිය. එයට හේතුව ලෙස සඳහන්වී තිබුණේ එම ඉතිරිවීම වර්ෂයේ වියදම් පාලනය කිරීමක් නිසා සිදු වූ ඉතිරිවිමක් ලෙසය. එසේ වුවද වර්ෂය අවසානයේ එම වැය විෂය වන 211.1.2.0.1205 වර්ෂයට අදාලව බැරකම ලෙස 2022 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් පිලිබඳ ප්‍රකාශයේ රු.586,014,129 ක් දෙපාර්තමේන්තුව බැරකම් වලට බැදී තිබුණි. | 211-1-2-0-1205 වෙනත් වැය විෂයෙහි ප්‍රතිපාදන ඉතිරි වීමට හේතු වූයේ භාණ්ඩාගාරයෙන් ගෙවීම් සිදු කිරීමට ප්‍රමාණවත් තරම් අක් මුදල් නොලැබීමයි. දෙපාර්තමේන්තුවේ මුද්‍රණ ක්‍රියාවලිය අඛණ්ඩව පවත්වා ගැනීමට අත්‍යවශ්‍ය අමුද්‍රව්‍ය මිලදී ගැනීමට සිදුවීම නිසා 211-1-2-1205 වෙනත් වැය විෂයෙන් බැදීම් ඇතිකර ගැනීමට සිදු විය. | තම වියදම් විචක්ශණ භාවයෙන් යුතුව කළමණාකරණය කිරිමට කඩිනම් පියවර ගත යුතුය. |

## 2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම රු. | අනුකූල නොවීම | | |
| (i) | 1989 මාර්තු 23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 19/89 හි 06 ඡේදය | 159,753,434 | අතිකාල දීමනා ලබා ගැනිමේදි වවුචර පිළියෙල කර සහතික කළ යුතු වුවද ඒ ඒ | දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය 1264 කි. ඔවුන් විවිධ අංශ වල රාජකාරි ඉටුකරන | අදාල චක්‍රලේඛය පරිදි ක්‍රියා කිරිමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රමයක් ස්ථාපිත කර |

| | | |
|---|---|---|
| කාර්යය මණ්ඩල සාමාජිකයා අතිකාල වවුචරයක් පිළියෙල නොකරන අතර කාල ගණක අංශය විසින් ලබාදෙනු ලබන පැය ගණනය අනුව අතිකාල ගෙවනු ලබයි. | අතර ඒ ඒ අංශ සඳහා වෙන වෙනම වැයපත් පිළියෙල කරයි. දෙපාර්තමේන්තුවේ 1264 ක කාර්ය මණ්ඩලය සඳහා එලෙස වැයපත් සකස් කිරීමට කටයුතු කලහොත් විශාල කාලයක් හා අතිරේක කාර්ය මණ්ඩලයක් ද අවශ්‍ය වේ. ඒබැවින් එක් එක් නිලධාරියා විසින් සේවය කරන ලද අතිකාල පැය ගණන පිළිබඳව තොරතුරු නිවැරදිව හා ස්වංක්‍රීයව දෙපාර්තමේන්තුවේ පරිගණක පද්ධතිය හරහා ලබාගත හැකිවන පරිදි පරිගණක පද්ධතිය සකස් කර එම තොරතුරු අනුව දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා අතිකාල ගණනය කිරීම සිදු කරනු ලබන බව කාරුණිකව දන්වමි. | කඩිනමින් චක්‍රලේඛය පරිදි කටයුතු කල යුතුය |

## 2.5 තැන්පත් ශේෂයන්

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------------- | -------------------------- | ------------ |
| (අ) | දෙපාර්තමේන්තුවේ තැන්පතු ගිණුමේ වාණිජ මුද්‍රණ තැන්පතු ලෙජරයේ | 2021 වර්ෂයට අදාළ මුදලින් මේ වන විට ඉතිරිව ඇත්තේ රු. 38,350,678 ක් වන අතර | දෙපාර්තමේන්තුවට ලැබෙන ඇණවුම් ප්‍රමාදයකින් තොරව අවසන් කිරීමට හැකි අයුරින් |

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂය රු. 96,271,633 ක් වු අතර මින් රු. 53,362,373 ක් 2021 වර්ෂයේ වාණිජ මුද්‍රණ සඳහා ලද අත්තිකාරම් ලෙස දක්නට ලැබුණි. නමුත් 2023 අප්‍රේල් 28 වන විටත් මින් රු.15,011,695 ක ඇණවුම් පමණක් නිමවා තිබුණි අතර මෙම අගය 2021 ලද මුළු ඇණවුම් වටිනාකමින් සියයට 28 ප්‍රමාණයකි. | රු. 15,011,695 ක මුදලකට අදාළ වාණිජ මුද්‍රණ ඇණවුම් සම්පූර්ණ කර ඇති බව කාරුණිකව දන්වමි. | අභ්‍යන්තර පාලන ක්‍රම කඩිනමින් සැලසුම් කර ක්‍රියාත්මක කරවිය යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය<br>----------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>-------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|
| (අ) නිසිකලට වේලාවට ටෙන්ඩර් කටයුතු සිදු නොකිරීම නිසා තිරණ ගැනිමට ප්‍රමාද විම මත 2021 වර්ෂයේදි දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන ක්‍රියාවලියෙන් ඉවතලන අස්කොන් කඩදාසි කිලෝග්‍රෑම් 50,920 ක ප්‍රමාණයක් කිලෝග්‍රෑම් එකකක් රු. 65 කට මිලට ගැනිමට නව ගැණුම්කරු එකඟව තිබියදී පෙර ගැණුම්කරුටම කිලෝග්‍රෑමයක් රු. 26.50 කට අලවිකිරීම නිසා දෙපාර්තමේන්තුවට රු. 1,960,420ක පාඩුවක් සිදු වී තිබුණි. | දෙපාර්තමේන්තුවේ කාලාන්තරයක් එක් රැස් ව තිබු මෙම ඉවතලන අස්කොන් කඩදාසි විවිධ උවදුරු වලට ලක්ව ඇති කඩදාසි වේ. මෙය තුල ගබඩාවේ ඇති වු ගින්නෙන් වු හානි වු තොගද ඇතුළත්ව ඇත. මෙම ගබඩාව පිරිසිදු කිරිම සඳහා මෙම අස්කොන තොග පෙර කොන්ත්‍රාත් කරුටම ලබා දුනි. | ටෙන්ඩර් කටයුතු මනාව සැලසුම් කර කාලිනය සිදු කිරිමට හැකි පරිදි අභ්‍යන්තර පාලන ක්‍රම කඩිනමින් විධිමත් කල යුතුය.තවද දෙපාර්තමේන්තු පරිශ්‍රයෙන් ඉවත් කර ගන්නා තුරු මෙම අබලි භාණ්ඩ සඳහා විධිමත් ආරක්ෂාවක් ලබා දීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නිසි කලට ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම නිසා 2021 වර්ෂයේ අවසාන මාස තුන තුලදී ඉවත ලන අස්කොන් කඩදාසි කිලෝග්‍රෑමයක් රු. 65 කට නව ගැණුම්කරුට අලවී කිරීමට හැකියාව තිබියදී පෙර ගැණුම්කරුටම කිලෝග්‍රෑමයක් රු. 26.50 කට අලවිකිරීම නිසා දෙපාර්තමේන්තුවට රු.10,234,455ක පාඩුවක් සිදු වී තිබුණි. | 2021 වර්ෂයේ පැවති කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ප්‍රසම්පාදන කටයුතු නිසි ලෙස සිදු කිරීමට නොහැකි විය. දෛයිනිකව එකතු වන මෙම අස්කොන් කඩදාසි හේතුවෙන් දෙපාර්තමේන්තු පරිශ්‍රයේ ඉඩකඩ කළමණාකරනය කර ගැනිම අපහසු විය. එම නිසා මෙම තොග තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මත ප්‍රසම්පාදන කමිටුව පෙර ගැනුම්කරුටම 2021 වර්ෂයේ අවසාන මාස 03 අස්කොන් කඩදාසි ඉවත් කර ගැනිමට අවස්ථාව ලබා දුනි. | ටෙන්ඩර් කටයුතු මනාව සැලසුම් කර කාලිනය සිදු කිරිමට හැකි පරිදි අභ්‍යන්ත පාලන ක්‍රම කඩිනමින් විධිමත් කල යුතුය. |
| (ඇ) | අලවි කරන තුරු දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන ක්‍රියාවලියෙන් ඉවත ලන අස්කොන් කඩදාසි සඳහා විධිමත් ආරක්ෂාවක් සැපයිමට නොහැකි විම නිසා 2021 වර්ෂයේ අස්කොන් කඩදාසි අලවියෙදී අවස්ථා 90 කදි සියයට 30ත් සියයට 50ත් අතර බර අඩු කිරිම නිසා දෙපාර්තමේන්තුවට ලැබිය යුතු රු.4,917,817 ක මුදලක් අහිමිවී තිබුණි. | මිට අදාල කාලසිමාව තුළ අස්කොන් කඩදාසි ගබඩාව නිසි ප්‍රමිතියකින් සකස් වී නොතිබුණු අතර එහි වහලය හා කාණු පද්ධතිය අවිධිමත්ව සකස්කර තිබුණි. මේ හේතුන් මත මෙම තත්වය උදා වී ඇත. එම නිසා මෙම තොග නියමිත ප්‍රමිතියෙන් නොතිබුණු අතර අවස්ථානුකුලව නියමිත බරෙන් 30%ක්, 50% වශයෙන් අඩුකර විකිණිමට කටයුතු කරන ලදී | දෙපාර්තමේන්තුවෙන් බැහැර කරන තුරු අදාල භාණ්ඩ සඳහා නිසි ආරාක්ෂාවක් සැපයීම සඳහා කඩිනමින් පියවර ගතයුතුය |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදි රු. 133,900 ක තරාදිය මිලදී ගැනිමේ ප්‍රසම්පාදනයේදි නියමිත පිරිවිතර හා තාක්ෂණික ඇගයිම් සිදු නොකිරිම නිසා රු.280,000 ක තවත් තරාදියක් මිල දී ගෙන තිබුණි.. | රු. 133,900.00 ක මිලකට මිලදී ගත් තරාදිය එහි නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා මිණුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීමේ දී මෙවැනි අලෙවි කවුළු සඳහා භාවිතා කරන තරාදි විකුණනු ලබන ආයතන එම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී තිබිය යුතු | සැලසුම් සහගත අයුරින් ප්‍රසම්පාද මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කරන්න. |

| | | | |
|---|---|---|---|
| | | බව අප වෙත දන්වන ලදි. අප විසින් තරාදිය මිල දී ගත් ආයතනය එලෙස බලපත්‍රලාභී ආයතනයක් නොවන බවට දැනුම් දුනි. එම නිසා 280,000.00 ක මිලකට වෙනත් තරාදියක් මිල දී ගැනීමට කටයුතු කරන ලදි. පෙර මිලදී ගත් තරාදිය දෙපාර්තමේන්තුවේ නිෂ්පාදන අංශයන් වෙත යොදා ගෙන ඇත. | |
| (ඉ) | භාවිතයෙන් ඉවත් කරන ලද මුද්‍රණ තහඩු විකිණීම අත්හිටවන ලෙස අමාත්‍යාංශ ලේකම් නියෝග කර තිබියදී එය නොසලකා හැර අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි විසින් ප්‍රසම්පාදනය නිවැරදි බවට සහතික කර තිබුණි. ඒ අනුව ප්‍රධාන ගණන් දිමේ නිලධාරියාගේ නියෝග නොසලකා සමාලෝචිත වර්ෂයේ භාවිතයෙන් ඉවත් කරන ලද මුද්‍රණ තහඩු වෙලදපොල මිල වු රු.761 කට විකිණීමට හැකියාව තිබියදි රු. 286.88 කට විකිණීම හේතුවෙන් දෙපාර්තමේන්තුවට උපයාගතව තිබූ රු. 1,051,361 මුදලක් අහිමි වී තිබුණි. | 2022.10.13 දිනැතිව ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් වෙනුවට ප්‍රධාන ගණකාධිකාරී විසින් අත්සන් කරන ලද ලිපියෙහි උපදෙස් අනුව එවකට මුද්‍රණ තහඩු විකිණීම සඳහා තෝරා ගෙන තිබූ කොන්ත්‍රාත් කරු වෙත ඉවතලන මුද්‍රණ තහඩු ලංසු කොන්දේසි අනුව විකිණීමට කටයුතු කරන ලදි. මෙම ප්‍රසම්පාදනය ක්‍රියාත්මක කරන අතරතුර වර්තමාන වෙළඳපොළ මිල උච්ඡාවචනයන් සලකා අප විසින් ලේක් හවුස් ආයතනයෙන් ඔවුන්ගේ ඉවතලන මුද්‍රණ තහඩු මිලදී ගනු ලබන ආයතන සම්බන්ධයෙන් විමසන ලද අතර, ඒ අනුව එම ආයතනයේ තහඩු තොග 1kg රු. 761.00 ක මුදලකට විකුණනු ලබන බව දන්වන ලදි. අප විසින්ද එම ආයතනයෙන් මේ සම්බන්ධයෙන් විමසන ලද නමුත් එම මිලට මෙම දෙපාර්තමේන්තුවේ තහඩු මිලදී ගැනීම ප්‍රතික්ෂේප කරන ලදි. එමෙන්ම එම මිලට මෙම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ පලමු නියෝග ක්‍රියාත්මක නොවිම හේතුවෙන් රජයට ලබාගත හැකිව තිබූ ආර්ථික වාසියක් අහිමිවුයෙද යන්න පරික්ෂාකර සුදුසු පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | දෙපාර්තමේන්තුවේ ඉවතලන තහඩු මිලදී ගැනීමට වෙනත් කිසිදු ආයතනයක්ද ඉදිරිපත් නොවුන බැවින් ප්‍රසම්පාදනය අනුව තෝරාගත් ගැනුම්කරු වෙත කාර්මික සංවර්ධන මණ්ඩලයේ මිල කමිටු වාර්තාවෙහි සඳහන් රු. 286.88 ක මුදලකට ප්‍රසම්පාදනය ප්‍රදානය කරන ලද ආයතනය වෙත තහඩු විකිණීමට කටයුතු කරන ලදි. | |
| (ඊ) | භාවිතයෙන් ඉවත් කරන තහඩු විකිණීමට අදාලව පුවත්පත් දැන්වීම, ලංසු කොන්දේසි සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ මෙන්ම, ටෙන්ඩර් දැන්වීම් පල කිරිම, ලංසු කැඳවීම, ලංසු විවෘත කර තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශ ලබා ගැනිම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අභිමතය පරිදි සිදු කොට පසුව ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගෙන තිබුණි. එනම් ප්‍රසම්පාදන කමිටුව හුදෙක්ම සිදු කර ඇත්තේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ තීරණ අනුමත කාරිම පමණි. තවද ජනමාධ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (පාලන), මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා සහ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරි මෙම ප්‍රසම්පාදන කමිටුවේ සාමාජිකයින් වූ අතර කමිටුවට සහභාගි විම මත දිමනාද ලබාගෙන තිබුණි. | 2021 වර්ෂයේදී රට තුළ පැවති කොවිඩ් 19 වසංගත ව්‍යාප්තිය සමඟ කාර්යාල කටයුතු සීමාවීම, නිරෝධායන ඇඳිරිනීතිය පැනවීම, සංචරණ සීමා පැනවීම වැනි තත්ත්වයන් මත මෙම ප්‍රමාදය සිදුවිය. | කොවිඩ් 19 වෛරසය ව්‍යාප්ත වී ගිය කාල වකවානුවේ දී රාජ්‍ය සේවය බාධාවකින් තොරව පවත්වා ගත යුතු බවට 2021 අප්‍රේල් 27 දිනැති අංක 02/2021(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මඟින් දෙපාර්තමේන්තු ප්‍රධානියාට උපදෙස් ලබා දී ඇත. එම නිසා ඉදිරියට මෙවැනි ප්‍රමාදයන් අවම වන අකාරයට ප්‍රසම්පාදනයන් සැලසුම් කල යුතුය. |

### 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය<br>------------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>--------------------------------- | නිර්දේශය<br>------------ |
| --- | --- | --- |
| 1964 අංක 28 දරන ඉඩම් අත්පත් කර ගැනිමේ පනතේ 460 පරිච්ඡේදයේ 44 වගන්තිය යටතේ 2003 ජනවාරි 31 දින කතරගම ප්‍රාදේශීය ලේකම් මඟින් මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත 2003 ජනවාරි 31 දින පවරා තිබු විශාලත්වය හෙක්ටයාර් 0.105 ක් වූ ඉඩම රජයේ ආයතනයක් නොවන රජයේ මුද්‍රණාලිය සමුපකාර සකසුරුවම් හා ණය දෙන සමිතිය යන ආයතනයේ පරිහරණයට ලබා දී තිබුණි. | රජයේ මුද්‍රණාලයීය සමුපකාර සකසුරුවම් හා ණය දෙන සමිතිය බාහිර ආයතනයක් නොවන අතර, දෙපාර්තමේන්තු සාමාජිකයින් විසින් පවත්වාගෙන යනු ලබන සමුපකාර සුබසාධන සමිතියකි. එම සමිතිය විසින් අදාළ කටයුතු සිදු කරනු ලබන්නේ රජයේ මුද්‍රණාලයාධිපතිගේ පූර්ණ අධීක්ෂණය යටතේ වන අතර, අදාළ ඉඩම එම සමිතියේ පෞද්ගලික කටයුතු සඳහා යොදා ගැනීමට හෝ වෙනත් ප්‍රතිලාභයන් ලබා ගැනීමට අවස්ථාවක් ලබා දී නොමැති බව සඳහන් කරමි.<br><br>තව ද, මෙම ඉඩම් තක්සේරු කර ඉදිරියේ දී රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ වත්කමක් ලෙස ලේඛනගත කිරීම සඳහා කටයුතු කරනු ලබන බව කාරුණිකව සඳහන් කරමි. | මෙම ඉඩම රජය සතු ඉඩමකි. දෙපාර්තමේන්තු සේවකයන්ගෙන් සමන්විත රජයේ මුද්‍රණාලයීය සමුපකාර සකසුරුවම් හා ණය දෙන සමිතිය රාජ්‍ය ආයතනයක් නොවේ. එම නිසා එම සමිතිය පුද්ගලික ආයතනකී. එම නිසා රජය සතු වත්කම් පුද්ගලික පාර්ශවයන්ට පැවරීම් කල නොහැක. |

## 3.3 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>----------------------------------- | නිර්දේශය<br>-------------- |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදි අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් පෙළ පොත් වර්ග 06 කින් පිටපත් 1,028,000 ක් මුද්‍රණය සඳහා ලබා දි තිබුණද මෙම ඇණවුම් දින 27 සිට දින 156 දක්වා ප්‍රමාද වී මුද්‍රණය කිරිම නිසා රු.4,832,545 ක ආපසු ලබා දී ඇති ප්‍රමාද ගාස්තු වලට අමතරව ප්‍රමාද ගාස්තු අය කර ගැනිම හේතුවෙන් පාඩුවක් සිදුවී තිබුණි. | අප දෙපාර්තමේන්තුවට නොවැලැක්විය හැකි හේතුන් නිසා අදාළ ප්‍රමාදයන් සිදු වී ඇති බැවින්, එසේ අයකර තිබූ ප්‍රමාද ගාස්තු අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් නැවත දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති බව දන්වා සිටිමි. | ප්‍රමාදයන් සිදු වන අංශ කඩිනමින් හදුනාගෙන නැවත ප්‍රමාදයන් ඇති නොවිමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ආ) | 1997 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 97/5232/17/035 පරිදි 1998 ජනවාරි මස සිට වාණිජ මුද්‍රණ දිමනාව දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින්ට ගෙවනු ලබන අතර එහිදි එක් මාසයක වාණිජ මුද්‍රණ ඇනවුමෙහි (ඉන්වොයිසි වටිනාකම) වටිනාකම ස්ථාවරව පවතින පාදක මුදල වන රු. මිලියන 40ට අනුපාත කර ඉන් සියයට 65 අගය නිලධාරියාගේ මුලික වැටුපෙන් ගුණකර වාණිජ මුද්‍රණ දීමනාව ගෙවීම සිදු කරනු ලැබේ. වර්ෂ 23 කටත් වඩා පැරණි | රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ ගෙවනු ලබන දිරි දීමනා වඩාත් සරල ක්‍රමවේදයක් ඔස්සේ සකස් කර ඉදිරිපත් කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශය වන ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිලධාරින්ගේ සභාපතිත්වයෙන් හා සාමාජිකත්වයෙන්ද, ආයතන අධ්‍යක්ෂ ජනරාල් නියෝජනය වන පරිදි කමිටු සාමාජිකයින්ගෙන්ද සමන්විතව කමිටුවක් මඟින් වාර්තාවක් සකස් කර ඉදිරිපත් කර තිබූ අතර, එයට වැඩිමනත් වශයෙන් අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරන ලද කමිටුවක් මඟින් ද තවදුරටත් සමාලෝචනය කර නිර්දේශ | වාණිජ මුද්‍රණ දිමනා ගෙවිමේදි භාවිතා කරන මෙම වසර 22 ක් පැරණි පාදක අගය (මිලියන 40) කඩිනමින් සංශෝධනය කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පාදක අගය පදනම් කරගනිමින් වාණිජ මුද්‍රණ දිමනාව ගෙවීම සිදුකරන අතර එම වටිනාකම වැඩිකර ගණනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ලබාදුනි. ඊට මාණ්ඩලික නිලධාරින් සඳහා ද දිරි දීමනා ක්‍රමවේදයක් යෝජනා කර ඇතුලත් කර ඇත. ඒ අනුව, අදාළ ආයතන වෙත යොමු කර අනුමැතිය ලබා ගැනීමට හා අමාත්‍ය මණ්ඩල සංදේශයක් සකස් කර අනුමැතිය ලබා ගැනීමට අදාළ කටයුතු රේඛීය අමාත්‍යාංශය මඟින් කටයුතු නිම කරමින් පවතී. | |
| (ඇ) | වානිජ මුද්‍රණ දීමනාව ගෙවීමේදි සපුරා ලිය යුතු බවට අමාත්‍ය මණ්ඩල තීරණයේ දක්වා තිබූ කොන්දේසි වන පිරිවැය ගිණුම්කරන පද්ධතියක් හඳුන්වා දීම, මුද්‍රණ කටයුතු වල නිෂ්පාදන ඵලදායිත්වය වැඩිදියුණු කිරීම සහ හඳුනාගත් ප්‍රතිපාදනයන් සහිත ව්‍යාපෘතියක් ඇති කිරීම හෝ එයට විකල්පයක් ලෙස අත්තිකාරම් ගිණුමක් ඇති කිරීම යන කොන්දේසි තුන 1998 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වාම සපුරා නොතිබුණ | නිෂ්පාදන ආයතනයක් වන මෙහි පවතින සංකීර්ණ තත්ත්වය හේතුවෙන් මෙම ප්‍රමාදය සිදු වී ඇත. මේ වන විට නිෂ්පාදන ගිණුම් සැකසීම සඳහා අවශ්‍ය මූලික කටයුතු ආරම්භ කර ඇති අතර, 2024.01.01 දින සිට වාණිජ අත්තිකාරම් ගිණුම් සැකසීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව කාරුණිකව දන්වමි | කඩිනමින් අමාත්‍ය මණ්ඩල තිරණයේ දක්වා ඇති කොන්දේසි ඉටු කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක ආ/8/3/706/969/21 හා 2008 දෙසැම්බර් 02 දිනැති ලිපිය අනුව නිෂ්පාදන තත්ත්වය නඟා සිටුවීම සඳහා ගෙවනු ලබන දිමනා දැනට සේවකයෙකු ලබන වැටුපෙන් සියයට 65ක් වන සේ 2018 වර්ෂය දක්වා අනුමත කර තිබුණි. එසේ වුවද මුද්‍රණ දෙපාර්තමේන්තුවේ සේවකයන් සඳහා ඔවුන්ගේ | මෙම දෙපාර්තමේන්තුවේ දීමනා ගෙවීම සඳහා වරින් වර ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගෙන ඇති අතර, ඒ අනුව 2018 වර්ෂය දක්වා එසේ අනුමැතිය ලබා දී ඇත. 2019 වර්ෂයට අදාළව ද දීමනා ගෙවීමට අනුමැතිය ලබා ගැනීම සඳහා යොමු කර ඇත. | 2019 වර්ෂයේ සිට ආයතන අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අනුමැතියකින් තොරව දිමනා ලබාගෙන ඇත. අදාල දිමනා සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මාසික වැටුපෙන් සියයට 65 ඉක්මවා සියයට 85 සිට සියයට 366 ක් දක්වා විවිධ වර්ගයේ දිමනා වර්ග 07 ක් මාසිකව ගෙවා තිබූ බවට දෙපාර්තමේන්තුවේ අංශයක් තුල සිදුකල පරික්ෂාවකදි අනාවරණය විය. එකතුව රු.12,437,912 ක් එම අංශයේ නිළධාරින්ට සමාලෝචිත වර්ෂයේදි මාස 8 කදී ගෙවා තිබුණි. | | |
| (ඉ) | 1981 දෙසැම්බර් 16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව දෙපාර්තමේන්තුවේ හදිසි මුද්‍රණ කාර්යයන් කඩිනමින් කිරීමට ඇතැම් වැඩ කොටස් වෙනුවෙන් අතිකාල දීමනා වෙනුවට වැඩ කොටස් අනුව ගෙවීමේ ක්‍රමයක් සඳහා අනුමැතිය ලැබී තිබුණි. එම අමාත්‍ය මණ්ඩල තීරණය සිදු කර වර්ෂ 40 ක් ගතවී තිබු නමුදු කැලී පදනම මත දීමනා ගෙවිය යුතු වැඩ කොටස් කවරේද යන්නත් එම දීමනා සඳහා ගෙවිය යුතු රේටයන් කවරේද යන්නත් නිවැරදිව හඳුනා නොගෙන එකම කාර්යයක් වෙනුවෙන් අතිකාල හා කැලී පදනම මත දීමනා යන දෙවර්ගයම ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේදි දෙපාර්තමේන්තුවේ එක් අංශයක සිදු කල විගණන පරික්ෂණයකදි පලමු මාස 08 තුල කාර්යය මණ්ඩලයේ සමාජිකයින් 21කට අතිකාල දිමනා ලෙස රු.1,301,008 ක්, | මේ වන විට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දිරිදීමනා සම්බන්ධයෙන් සමාලෝචනයක් සිදුකර යෝජිත දිරිදීමනා අනුමත කර ගැනීමේ අවසන් අදියරේ පවතී. එහි දී එකම රාජකාරියකට එකම වේලාවක් තුළ එක් දීමනාවක් පමණක් ලබාගත හැකි වන පරිදි ක්‍රමවේදයක් සකස් කර ඇත. ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට අදාළ කටයුතු රේඛීය අමාත්‍යාංශය මඟින් සිදු කරමින් පවතී. | අමාත්‍ය මණ්ඩල තිරණය පරිදි හෝ යාවත්කාලීන සාධාරණ පදනමක් මත ගෙවීම් ක්‍රමයක් ස්ථාපිත කිරිම කඩිනමින් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කැලි ගණනට දිමනා ලෙස රු. 8,266,277 හා කණිෂ්ඨ කාර්යය මණ්ඩලයේ සමාජිකයින් 05 කට අතිකාල දිමනා ලෙස රු. 266,457 ක්, කැලි ගණනට දිමනා ලෙස රු. 813,707 ක් ගෙවා තිබුණි. | | |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන විට දෙපාර්තමේන්තුවේ සේවය නොකරන නිලධාරින් 24 දෙනකුගෙන් අය විය යුතු රු.3,072,375 ක ණය ශේෂ වසර 5ත් 25ත් අතර කාලයක් යන තුරු අයකර ගැනිමට අසමත් වී ඇත. | ණය ශේෂ නිරවුල් කිරිමට අවශ්‍ය පියවර ගනිමින් පවති | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කඩිනමින් නිරවුල් කිරිමට කටයුතු කල යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ විධායක ශ්‍රේණියේ නිලධාරින් 08 දෙනකු තම නිත්‍ය තනතුරේ රාජකාරි වලට අමතරව වෙනත් තනතුරු දීර්ඝ කාලිනව වැඩ බලන බවටත් එම වැඩ බැලිමේ කාලය මාස 06 සිට 29 දක්වා කාලයක් ගන්නා බවත් මේ සඳහා වැඩබැලිමේ දිමනාව ලෙස රු.2,309,329 ක් ගෙවා ඇති බවත් නිරික්ෂණය විය. | රාජ්‍ය සේවයේ බඳවා ගැනිම් කමිටුවේ අනුමැතිය ලද වහාම විභාග නිවේදනය ගැසට් නිවේදනයේ පළකර බඳවා ගැනීමට අදාළ කටයුතු සිදු කරනු ලබන බවට දැනුම් දෙමි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කලයුතුය. |